**රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
වෙත යොමු කරන ලද
2023 හා 2024 වර්ෂ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා
2022 හා 2023 වර්ෂ සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික වාර්තා
සම්බන්ධයෙන්
රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව
පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ
**රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති**
**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා, පා.ම. විසිනි**
**2025 ඔක්තෝබර් මස 23 වැනි බ්‍රහස්පතින්දා**

**ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு**
**ஆற்றுப்படுத்தப்பட்ட**
2023 மற்றும் 2024 ஆம் ஆண்டுகளுக்கான பாதுகாப்பு அமைச்சின் வருடாந்த செயலாற்றுகை
அறிக்கைகள்
2022 மற்றும் 2023 ஆம் ஆண்டுகளுக்கான தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவனத்தின்
ஆண்டறிக்கைகள்
தொடர்பான
ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின்
அறிக்கையானது
**ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் தவிசாளர்**
**கௌரவ (டாக்டர்) நஜீத் இந்திக்க, பா.உ அவர்களால்**
**பாராளுமன்றத்திற்குச் சமர்ப்பிக்கப்பட்டது.**
**2025 ஒக்தோபர் 23 ஆம் திகதி வியாழக்கிழமை**

Report of the
**Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection**
regarding the
Annual Performance Reports of the Ministry of Defence for the years 2023 & 2024
Annual Reports of the National Building Research Organization for the years 2022 & 2023
referred to the
Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection
Presented to Parliament by
**The Hon. (Dr.) Najith Indika, M.P.**
**Chair of the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection**
**Thursday, 23 October 2025**

<u>කාරක සභාවේ වාර්තාව</u>

2025 සැප්තැම්බර් මස 11 වැනි දින පාර්ලිමේන්තුවේදී රැස් වූ රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පහත සඳහන් කාර්යසාධන/ වාර්ෂික වාර්තා සලකා බලන ලදී.

- **2024 වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව** (2025.08.05 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)

- **2023 වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව** (2024.07.10 වැනි දින නවවැනි පාර්ලිමේන්තුවේ ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදුව, 2025.05.02 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී ගනු ලැබූ තීරණය පරිදි දසවැනි පාර්ලිමේන්තුවේ රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී.)

- **2023 වර්ෂය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික වාර්තාව** (2025.07.25 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)

- **2022 වර්ෂය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික වාර්තාව** (2023.11.23 වැනි දින නවවැනි පාර්ලිමේන්තුවේ ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදුව, 2025.05.02 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී ගනු ලැබූ තීරණය පරිදි දසවැනි පාර්ලිමේන්තුවේ රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී.)

<u>සහභාගී වූ කාරක සභික මන්ත්‍රීවරුන්</u>

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා,පා.ම. (සභාපති)
ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම.
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා, පා.ම.
ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය, පා.ම.
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා, පා.ම.

<u>සහභාගී වූ කාරක සභික නොවන මන්ත්‍රීවරුන්:</u>

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා, පා.ම., ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය

වූලා හේරත් මහත්මිය, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන), කාරක සභාවේ ලේකම්

<u>සහභාගී වූ නිලධාරීන්</u>

<u>ආරක්ෂක අමාත්‍යාංශය</u>

ගාමිණී මහගමගේ මහතා, අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු සහ ප්‍රතිපත්ති)
ඩී.එම්.එස්. දිසානායක මහතා, අතිරේක ලේකම් (ආරක්ෂක සේවා)
හර්ෂ විතානාරච්චි මහතා, අතිරේක ලේකම් (පරිපාලන) සහ අනෙකුත් නිලධාරීන්

<u>ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය</u>

මහාචාර්ය ආසිරි කරුණාවර්ධන මහතා, අධ්‍යක්ෂ ජනරාල්
කුමුදු රන්දෙණිය මහත්මිය, අධ්‍යක්ෂ (මුදල්) සහ අනෙකුත් නිලධාරීන්

උක්ත වාර්තා සියල්ල පිළිබඳව කාරක සභාවේදී සාකච්ඡා කරන ලද අතර, අදාළ ආයතනවල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය පිණිසත් සමස්ත මහජනතාවගේ යහපත උදෙසාත් එකී ආයතන කටයුතු කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව අවශ්‍ය උපදෙස් හා නිර්දේශයන් කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද අතර, එම වාර්තාවල සැලකිය යුතු දෝෂ නොතිබූ බැවින් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි කාරක සභාව විසින් තීරණය කරන ලදී.

<u>කාරක සභා තීරණ</u>

සලකා බැලීමෙන් අනතුරුව, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද යථෝක්ත කාර්යසාධන/ වාර්ෂික වාර්තාවන්ට එකඟ වූ අතර ඒ පිළිබඳව සකසන ලද මෙම වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා, පා.ම. විසින් 2025 ඔක්තෝබර් මස 23 වැනි දින පාර්ලිමේන්තුවට පිළිගැන්වීමට තීරණය කරන ලදී.